www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජනතා විමුක්ති පෙරමුන බුෂ් පාලනාධිකාරය ඉදිරියේ දනින් වැටෙයි

**Sri Lanka: JVP grovels to the Bush administration**

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2005 මැයි 09**

ජනතා විමුක්ති පෙරමුනේ නායකයන් ද එක්සත් ජනපද නිලධාරීන් ද අතර පසුගිය දා කොලඹදී පැවැත්වුනු හමුවක් එම පක්ෂයේ අධිරාජ්‍ය විරෝධී අලංකාර වාග් හරඹය ද සමාජවාදී ඉරියව් පෑම ද බොරු මවා පෙන්වීම් බව එළිදරව් කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) 1960 ගනන්වල දී නිර්මානය කරන ලද්දේ මාවෝවාදය, ගුවේරාවාදය සහ සිංහල වර්ගවාදය කලතා පෙරා ගත් රැඩිකල්වාදී දෘෂ්ටිමය කසිප්පුවක් මගින් ලංකාවේ දකුනු පලාත්වල දුප්පත් ගම්බද තරුනයන් පොලඹවා ගැනීමෙනි. එම සංවිධානය අද ප්‍රථම වතාවට ඇමැති පට්ටම් කිහිපයක් ද ලබා ලංකාවේ ධනපති ක්‍රමයේ දීර්ඝ කාලීන කනුවක් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කනිෂ්ට හවුල්කරුවා ලෙස ධනේශ්වර ආන්ඩුවක් පවත්වා ගෙන යාමට කරබඳු වී සිටී.

ජනතා විමුක්ති පෙරමුනේ දේශපාලන ආස්ථානය විලක්ෂනය වී ඇත්තේ ප්‍රතිගාමී සිංහල ජාත්‍යොත්තමවාදය සහ රටේ දිග්ගැසුන සිවිල් යුද්ධය අවසාන කිරීම සඳහා එල්ටීටීඊ සංවිධානය සමග කුමන හෝ සාම සාකච්ඡාවක් පැවැත්වීමට දක්වන විරෝධය මගිනි. මෙම සංවිධානය සමාජවාදය පිලිබඳව ඉඳහිට කරන කතා ඉතුරු කරගෙන සිටින්නේ සරසවි උයන්වල පැවැත්වෙන රැස්වීම් සහ ඉන්දියාව හෝ චීනයට යන විදේශ ගමන්වල දී මෙම රටවල ස්ටැලින්වාදී පක්ෂවල සිටිනා තමන් වැනි "කොමියුනිස්ට්වාදීන්" සමග කරට අත දමාගැනීම සඳහා ය.

අප්‍රේල් 20 දා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ පවත්වන ලද රැස්වීමට ජවිපෙ ප්‍රධාන නායක හා දෘෂ්ටිවාදියා වන සෝමවංශ අමරසිංහ ද, ජවිපෙ මන්ත්‍රී සහ සන්ධාන ආන්ඩුවේ සංස්කෘතික කටයුතු පිලිබඳ ඇමති විජිත හේරත් ද, දකුනු ආසියාව සඳහා එක්සත් ජනපද උප රාජ්‍ය ලේකම් ක්‍රිස්ටිනා රොකා ද එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලුන්ස්ටඩ් ද සහභාගී වූහ. ජනතා විමුක්ති පෙරමුන අධිරාජ්‍යවාදී තානාපති කාර්යාලයට සාකච්ඡා සඳහා ගිය ප්‍රථම වතාව මෙය නො වේ. - මෑත අවුරුදුවල දී, මෙය හුරුපුරුදු අඩිපාරක් බව ට පත් විය - එහෙත් මෙවර සාකච්ඡාව මෙතෙක් පවත්වන ලද ඒවායින් ඉහලම මට්ටමේ එක වූයේ ය.

රොකා කොලඹට පැමින සිටියේ දරුනු ලෙස සුනාමි ව්‍යසනයට හසුව ඇති ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත්වල ආධාර බෙදාහැරීම සඳහා ලංකාවේ ආන්ඩුව සහ එල්ටීටීඊය අතර ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවා ලීමට තල්ලුවක් දීමට ය. ජවිපෙ මෙම සැලැස්මට විරුද්ධ වීම ද මෙම ප්‍රශ්නය උඩ ආන්ඩුවෙන් ඉවත්වීමට එය තර්ජනය කර සිටීම ද බොහෝ දුරට මෙම සැලැස්ම ඇනහිටුවීමට හේතු වී තිබේ. එල්ටීටීඊයට දෙන සුලු හෝ සහනයක් ශ්‍රී ලංකා එනම්, සිංහල, ජාතික රාජ්‍යයට දක්වෙන රාජද්‍රෝහිත්වයක් ලෙස ජවිපෙ සලකයි.

ශ්‍රී ලංකාවේ අවුරුදු 20 ඉක්මවා ගිය සිවිල් යුද්ධයට සාකච්ඡා මගින් විසඳුමක් ලබා දීමට බුෂ් පාලනාධිකාරය තැත් කරන්නේ ශ්‍රී ලංකාවේ ජනතාව කෙරේ දක්වෙන අනුකම්පාවක් නිසා නොව, මෙම සිවිල් යුද්ධය දකුනු ආසියාව තුල ඇතිකරන අස්ථායිකාරී බලපෑම මෙම ප්‍රදේශය තුල එක්සත් ජනපදයේ ආර්ථික හා යුද්ධෝපායික අභිප්‍රායන්ට තර්ජනයක් වන නිසා ය. රොකා ජ්‍යෙෂ්ට ආන්ඩු හා විපක්ෂ නායකයන් හමුවීමෙන් පසුව ජනතා විමුක්ති පෙරමුනේ නියෝජිතයන් කැඳවා ඒකාබද්ධ යාන්ත්‍රනය ද ඊනියා සාම ක්‍රියාවලිය ද යලි ඇරඹීමට ඔවුන් ද සහාය දිය යුතු යයි කියා සිටියා ය.

තමා මේ ගනුදෙනු කරන්නේ සමාජවාදීන් සමග නොවන බව රොකා මැනවින් දන සිටියා ය. ඇය වනාහි හොඳට තැම්බුනු කිසිදු තෙතමනයක් නැති හිටපු සීඅයිඒ නිලධාරිනියකි. ඇ ඇෆ්ඝනිස්ථානයේ සෝවියට් ආධාරලත් පාලන තන්ත්‍රයට එරෙහිව ඉස්ලාමීය මූලධර්මවාදී හටයන්ට මුදල් සහ ආයුධ සැපයීම ද ඔවුන් පුහුනු කිරීම ද සඳහා 1980 ගනන්වල ක්‍රියාත්මක වූ රහසිගත එක්සත් ජනපද ව්‍යායාමයතුල දී සිය මුල් පුහුනුව ලබාගත්තී ය.

මෙවන් සාකච්ඡා පිලිබඳ මාධ්‍ය වාර්තා සීමා සහිත ය; නො පැහැදිලි ය. සුනාමි ආධාර සඳහා ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවීම එල්ටීටීඊය සමග සාමය අටවා ගැනීම දෙසට ගත් පියවරක් වනු ඇතැයි රොකා තර්ක

කලා ය. ජවිපෙ මෙම ආස්ථානයට එකඟ වූයේ නැත. එල්ටීටීඊය කොළඹ ''ප්‍රධාන ප්‍රජාතන්ත්‍ර දේශපාලන ප්‍රවාහය තුලට'' ගෙන ඒමට එක්සත් ජනපදය උත්සාහ කරන බවට රොකා සහතික විය යුතු ය යි අමරසිංහ රොකාට කියා සිටියේ ය. එහෙත් ''සාම ක්‍රියාවලියටද'' උතුරු නැගෙනහිර පලාත්වලට ප්‍රාදේශීය ස්වයං පාලනයක් සඳහා එල්ටීටීඊයේ සැලසුම්වලට ද හරස්ව සිටින ජවිපෙ යෝජනාව රොකා ප්‍රතික්ෂේප කලා ය.

එහෙත් මෙම මාධ්‍ය වාර්තාවලට වඩා, බෙහෙවින් එලිදරව්කාරී වූයේ අමරසිංහ අත්සන් කොට රොකාට දුන් පිටු දෙකේ ලියවිල්ල යි. මෙම ලියුම ලබා ගත් ලංකාවේ වෙබ් අඩවියක් (Lanka Truth) එය පලකලේ ය. විවරනීය ලෙස අකුටිල වූ මෙම ලිපිය මගින්, ජනතා විමුක්ති පෙරමුන ශ්‍රී ලංකාව කරගෙන යන්නා වූ ''ප්‍රජා පීඩනයට එරෙහි යුද්ධය'' - එනම් දෙමල සුලු ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගා දැමීමට කොලඹ පාලනය ගෙන යන්නා වූ යුද්ධය - යලිත් පටන් ගැනීම සඳහා එක්සත් ජනපදයේ ආධාරය ලබා ගැනීම් වස් බුෂ් පාලනාධිකාරය ඉදිරියේ දනින් වැටී යාඥා කර සිටියේ ය.

රොකාට මොනයම් මැ හෝ වැරදි වැටහීමක් තිබුනා නම් එය මකා දැමීම සඳහා උත්සුක වූ ලිපිය ආරම්භ වූයේ ම ජවිපෙට විප්ලවය හෝ සමාජවාදයට කිසිදු සම්බන්ධයක් නැති බව පැහැදිලි කරමිනි. ''පාර්ලිමේන්තු පක්ෂයක් කරා හා මිශ්‍ර ආර්ථිකයක් කරා පරිවර්තනය වී ගැනීමට සූදානම් විප්ලවවාදී පක්ෂයක් බවට පත් වීමට අපි කැමැත්තෙන් සිටිමු'' යයි එය කියා සිටියේ ය. ''මිශ්‍ර ආර්ථිකයක්'' යනු ධනේශ්වර ආර්ථිකයට දී ඇති නිල සංඥා නාමය යි.

දෙසැම්බර් සුනාමියට ගොදුරු වූවන්ට සහනාධාර සැපයීම සඳහා ''මානවහිත ප්‍රයත්නයකට ය''යි ශ්‍රී ලංකාවට ඇමරිකානු මැරයින් භටයන් එවීම ගැන මෙම ලියවිල්ල බුෂ් පාලනාධිකාරය කෘතඥතාවය පල කලේ ය. ඒ අතර මෙම ඇමරිකානු මෙහෙයුමට පිටුපසින් පැවති සැබෑ චේතනා ගැන කිසිවක් සඳහන් නො කිරීමට වග බලා ගැනිනි. සත්‍යය නම් දකුනු ආසියාවේ මිලිටරි කඳවුරු යලි තහවුරු කර ගැනීමට වොෂින්ටනයට දිගු කලක් පැවති අභිප්‍රාය සඳහා සුනාමිය විසින් ප්‍රයෝජනවත් ව්‍යාජ හේතුවක් සම්පාදනය කර දී තිබුන බව ය. එක්සත් ජනපදය සුනාමියෙන් ඉක්බිත්තේ ශ්‍රී ලංකාවට මැරයින් භටයින් එවීම වනාහී 1975 වියට්නාමයේ දී සිය හමුදා ලත් පරාජයෙන් පසුව මෙම ප්‍රදේශය තුල කරන ලද විශාලතම ඇමරිකානු යුද්ධ හමුදා විහිදුමේ කොටසක් විය.

## ජවිපෙ බුෂ්ගේ මහ පවයට සහය පුදයි

කෙසේ වුව ද වඩාත් අර්ථභාරී වූයේ ජවිපෙය ඇමරිකා එක්සත් ජනපදය දූන් සටන් වැද සිටින්නේ ''ප්‍රජාපීඩනයට'' එරෙහිව යෑ ''නිදහස'' සහ ''ප්‍රජාතන්ත්‍රවාදය'' සඳහා ය යන බුෂ් පාලනාධිකාරයේ මහ පවය වැලඳ ගැනීම යි. අමරසිංහගේ ලිපිය බුෂ්ගේ දෙවන ජනාධිපති වාරයේ සමාරම්භක දේශනයේ යට දැක්වෙන කොටස සහානුමතිකව උපුටා දැක්වූයේ ය. ''අපගේ දේශයේ නිදහසේ පැවැත්ම රැකෙනු ඇත්තේ වෙනත් දේශයන්හි නිදහස රැකී පැවැත්ම උඩ ය.'' ලිපිය බුෂ්ගේ එම දේශනයේ සඳහන් වූ එක්සත් ජනපදයේ අරමුන වනාහි, ''සෑම ජාතිය තුලමත්, සංස්කෘතිය තුලමත්, ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයන් සහ සංස්ථාවන් වර්ධනයට දිරි දී ... ලෝකය පුරාම ප්‍රජා පීඩනය අවසන් කර දැමීම ය'' යන ප්‍රකාශය ද වර්නනා කලේ ය.

ජෝර්ජ් බුෂ්ගේ මෙම ප්‍රකාශවල දෙගිඩියාවක් නැත. ඒවා සුජාත යයි ස්තෝත්‍ර කිරීමෙන් ජවිපෙ බුෂ් පාලනාධිකාරය ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය ආක්‍රමනය කොට අල්ලා ගැනීම ද ඇතුලු අතීත අපරාධයන්ට සහය පුදනවා පමනක් නොව අනාගත මිලිටරි මදාවි සඳහා කරන සූදානමට ද සහයෝගය දෙයි. බුෂ් යුද්ධය දියත් කිරීමට මවා ගන්නා ව්‍යාජ හේතුව සිය ප්‍රථම පාලනාධිකාර වාරයේ බුෂ් ඉදිරිපත් කල ''ත්‍රස්ත විරෝධී යුද්ධය'' යන සූත්‍රයේ සිට ''ප්‍රජා පීඩනයට එරෙහි'' යුද්ධය යන සංකල්පය දක්වා පලල් කිරීම තුලින් ඔහු අරමුනු කරගෙන ඉන්නේ ලෝකයේ කවර තැනක හෝ ඇමරිකානු ආක්‍රමනය යුක්ති සහගත කිරීම සඳහා සර්වග්‍රාහී යුක්ති ප්‍රතිපාදනයක් සම්පාදනය කිරීම ය.

ජවිපෙ වැනි පක්ෂයකට වුව ද මෙය අලුත් තැන් මාරුවකි. ජවිපෙ ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද ආක්‍රමනයට සහය දුන් අතර එරට විසින් ඉරාකය ආක්‍රමනය කිරීම ගැන සැරබාල විවේචන කරමින් මහ බලවතුන් අතර එක්සත් ජනපදයේ පිලිමලුන් වූ ප්‍රන්සය සහ ජර්මනිය යුද්ධය නැවැත්වීමට මැදිහත් වෙතැයි යන මිථ්‍යාව වගා කලේ ය. 2003 මාර්තුවේ දී කොලඹ පැවැත්වුනු යුද-විරෝධී රැලියක දී ජවිපෙ වාචාලයෙකු වන විමල් වීරවංශ වොෂින්ටනයේ ''අධිරාජ්‍යවාදී යුද්ධය'' හෙලා දකිමින් ද ඒ සමගම බැග්ඩෑඩ් ඒකාධිපතිත්වය වර්නනා කරමින් ද ''සදාම් හුසේන්ගේ වීරත්වයට ජයග්‍රහනය, සදාම් හුසේන්ගේ අධිෂ්ඨාන බලයට ජයග්‍රහනය'' යන තම අතීත වාග් හරඹවල රස හැඟැවෙන සටන්පාඨ මෙහෙය විය.

අමරසිංහගේ ලිපිය පෙන්නුම් කරන්නේ ඉක්බිති කාලයේ දී ජවිපෙය එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලා ගැනීමට පැවති සකල විරෝධය ම අතහැර දමා ඇති බව ය.

බුෂ්ගේ ''ප්‍රජාපීඩක විරෝධී යුද්ධයට''ආවැඩීමෙන් ජවිපෙ වොෂින්ටනයේ ලෝකාධිපති අභිප්‍රායන්ට ආධාර කරනවා පමනක් නොව ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට ආක්‍රමනකාරී ලෙස මැදිහත් විය

යුතු යයි ඉල්ලා සිටිමින් එවැනි මැදිහත් වීමකට ආධාර කිරීමකට පොරොන්දු වන බව ද පෙන්නුම් කෙරේ. එල්ටීටීඊ සංවිධානය ළමා භටයන් බඳවා ගන්නේ යයි ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කරන්නේ යයි ද, ඇමරිකානු නිලධාරිනියට තම ලියුමේ දී කියා සිටීම මගින් අමරසිංහ මෙම ''ප්‍රජා පීඩනයට'' එරෙහිව සටනට බැසගත යුතු යයි අධිරාජ්‍යවාදී සුපිරි බලවතා ඒත්තු ගැන්වීමට උත්සාහ දරයි.

අමරසිංහ ලිපියේ එක් ඡේදයකින් ඉල්ලා සිටින්නේ එක්සත් ජනපදය තුල සිටිනා එල්ටීටීඊ ආධාරකරුවෙකුට විරුද්ධව ධවල මන්දිරය නීතිමය පියවර ගත යුතු යයි කියා ය. එහි දී ඔහු එක්සත් ජනපදය එසේ කිරීමට පසු බට වුවහොත් එය, ''ඇමරිකානු ජනාධිපතිවරයාගේ දෙවන වර සමාරම්භක දේශනයේ අර්ථයට හා අධ්‍යාසයට එරෙහි වනු ඇති බවත්, 9/11න් ඉක්බිති බුෂ් පාලනාධිකාරය විසින් පනවන ලද ත්‍රස්තවාදී සංවිධානවලට ආධාර සපයන්නවුන් අත් අඩංගුවට ගැනීම එල්ල කර ගත් සිය රටේ ස්වදේශාරක්ෂක නීතිවලට පටහැනි වන'' බවත් ප්‍රකාශ කරයි.

බුෂ් පාලනාධිකාරයේ දරුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී අභ්‍යන්තර ආරක්ෂක නීතිරීතිවලට ජවිපෙය දක්වන සහාය විසින් විදහා දක්වෙන්නේ තමන් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට බලා සිටින ''ප්‍රජාතන්ත්‍රය'' මොන ජාතියේ එකක් ද යන්න ය. එල්ටීටීඊ සංවිධානයට අයත් යැයි සැක කරනු ලබන්නන් හිතුවක්කාර ලෙස සිරකර තැබීම සඳහා සැකසී ඇති අතීතයේ දී දහස් ගනන් දෙමල ජාතිකයන් අත් අඩංගුවට ගෙන සමහර අවස්ථාවල දී වධ බන්ධනයට පවා ලක් කිරීමට තුඩු දී ඇති ලංකාවේ පවත්නා දරුනු හදිසි නීතිවලට ද ජවිපෙය දිගු කලක් තිස්සේ සහාය දී ඇත.

එල්ටීටීඊයට එරෙහිව කොලඹ ආන්ඩුවේ පැත්තෙන් ලංකාවට ආක්‍රමනශීලී ලෙස මැදිහත් වීමට ජනතා විමුක්ති පෙරමුන දැන් (අප්‍රේල් 20 දා ) කර ඇති විවෘත ආයාචනය තරම් කෙලින්ම නො වූවත්, 'වහෙන් ඔරෝ' ආකාරයකට එක්සත් ජනපදයට සහ වෙනත් බලවතුන්ට එවැන්නක් කරන ලෙස ආයාචනා ප්‍රසිද්ධියේ ම යලියලිත් ඉදිරිපත් කරනු ලැබේ. අප්‍රේල් 26 දා අමරසිංහ එල්ටීටීඊය ද ඇතුලත් කර ගත් ඒකාබද්ධ සුනාමි යාන්ත්‍රනයක් පිහිටුවා ගන්නේ නැතිව ලංකාවට ''සාමය සඳහා මාර්ග සිතියමක්'' සම්පාදනය කර දෙන ලෙස ''ජාත්‍යන්තර ප්‍රජාවෙන්'' ඉල්ලා සිටියේ ය. ''ජාත්‍යන්තර ප්‍රජාව'' වෙනත් රටවලටත් ''මාර්ග සිතියම්'' සම්පාදනය කර ඇති බව මතක් කල හෙතෙම ලංකාව සඳහා ද එබන්දක් සැපැයිය යුතු යයි මාධ්‍ය වාර්තාකරුවන් අමතා ප්‍රකාශ කලේ ය.

ඇමරිකානු අධිරාජ්‍යවාදීන් විසින් සකසා ඇති වඩාත් සුප්‍රසිද්ධ ''මාර්ග සිතියම'' නම් දක්ෂිනාංශික ෂැරොන් ආන්ඩුවේ අනසක පිලිගැනීමට ද ඊස්රායලයට එරෙහි සන්නද්ධ පලස්තීන විපක්ෂය තලා දැමීමට ද එක්සත් ජනපදය විසින් නිරතුරු ගනු ලබන ප්‍රයත්නයේ කොටසක් ලෙස මැද පෙරදිගට පටවා ඇති ''මාර්ග සිතියම''යි.

අමරසිංහගේ ප්‍රකාශවල අර්ථය ඕනෑම දේශපාලන නිරීක්ෂකයෙකට පැහැදිලි ය. අප්‍රේල් 23 දා ඩේලි මිරර් පුවත්පතේ නිත්‍ය ලේඛක කීත් නොයර් රොකාට ජවිපෙ ලියූ ලිපිය උනන්දුවෙන් හා දිගට උපුටා දක්වමින් එහි අර්ථභාරය මෙසේ පැහැදිලි කලේ යඃ ''එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනිකව මැදිහත් වීමට බුෂ් පාලනාධිකාරයට කෙරෙන ඉල්ලීමක්''

නොයර්ගේ විවරනය යට දක්වෙන ආලංකාරික ප්‍රශ්නයෙන් සමාප්ත කැරිනඃ ''එල්ටීටීඊයට වුව ද ඒ හැටියට ගත හොත් යූඇන්පීයට හෝ ශ්‍රීලනිපයට වුව ද ජවිපයේ මෙම ප්‍රකාශය පරයාලිය හැකි ද? '' එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ඉදිරියේ දනින් වැටීමෙහි ලා නම්, (එම සංවිධානවලට පවා) ජවිපෙය පැරදවිය නොහැකි වනු ඇත.

දැනට රොකා සහය දී සිටින්නේ සුනාමි සාකච්ඡා යලි ඇරඹීම සඳහා සුනාමි ආධාර යාන්ත්‍රනයක් ඇති කිරීමට කුමාරතුංග ගෙන යමින් සිටින අඩාල ප්‍රයත්නයට ය. එහෙත් බුෂ් පාලනාධිකාරය කරබදු වීමට ජවිපෙ දක්වා ඇති කැමැත්ත රොකා සහතික වසයෙන් ම ලකුනු කර සිත තබාගන්නවා ඇත. ජවිපෙය අනාගතයේ දී එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මෙවලමක් ලෙස ප්‍රයෝජනවත් වනු ඇතැයි යන්න ඇයට හොඳට මතක තිබෙනු ඇත.

© www.wsws.org